# කුරුවිට ප්‍රාදේශීය සභාවේ කිරිඇල්ල පෙර පාසලට නවක ළමුන් ඇතුළත් කිරීම – 2027 වර්ෂය

## දරුවන් ඇතුළත් කිරීම සඳහා අයදුම්පත් කැඳවීමයි

කුරුවිට ප්‍රාදේශීය සභාව යටතේ පවත්වාගෙන යනු ලබන **කිරිඇල්ල පෙර පාසල** සඳහා 2027 අධ්‍යයන වර්ෂයට නවක ළමුන් ඇතුළත් කර ගැනීම සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ.

- **අයදුම්පත් ලබාගැනීම**

අයදුම්පත් **කුරුවිට ප්‍රාදේශීය සභා කාර්යාලයෙන්, කිරිඇල්ල උප කාර්යාලයෙන් නිල වෙබ් අඩවියෙන් හෝ පෙර පාසලෙන්** නොමිලේ ලබාගත හැකිය.

- **අයදුම්පත් භාරදීම**

සම්පූර්ණ කරන ලද අයදුම්පත් **2026 අගෝස්තු 24** වන දින සිට **2026 සැප්තැම්බර් 23** වන දින දක්වා කිරිඇල්ල උප කාර්යාලයට භාරදිය යුතුය.

****අයදුම්පත් භාරගන්නා අවසන් දිනය : 2026 සැප්තැම්බර් 23 වේ.**

අවසන් දිනයෙන් පසුව ලැබෙන අයදුම්පත් සලකා නොබලන අතර, එක් දරුවෙකු සඳහා **එක් අයදුම්පතක් පමණක්** භාරගනු ලැබේ.

### අයදුම්පත සමඟ ඉදිරිපත් කළ යුතු ලේඛන

- දරුවාගේ උප්පැන්න සහතිකයේ පිටපත.
- දෙමාපියන්ගේ ජාතික හැඳුනුම්පත් පිටපත්.
- පදිංචිය තහවුරු කිරීමේ ලේඛනය / ග්‍රාම නිලධාරී සහතිකය.
- දරුවාගේ එන්නත් කාඩ්පතේ පිටපත.
- අඩු ආදායම්ලාභී පවුලක් නම් ඒ බව තහවුරු කරන අදාළ ලේඛනය.

### ළමුන් තෝරාගැනීම

ළමුන් ඇතුළත් කිරීමේදී දරුවාගේ **වයස් සුදුසුකම, පදිංචිය, ලේඛන සම්පූර්ණත්වය, සමාජීය අවශ්‍යතා, පෙර පාසලේ ධාරිතාව සහ අනෙකුත් අදාළ නිර්ණායක** සලකා බලනු ලැබේ.(නිර්ණායක මේ සමඟ ඉදිරිපත් කෙරේ.)

සම්මුඛ පරීක්ෂණයක් පවත්වා සුදුසුකම් සලකා බලා දරුවන් තෝරාගැනීම සිදු කරනු ලැබේ.සම්මුඛ පරීක්ෂණය පවත්වන දිනය ඉදිරියේ දී දැනුම්දෙනු ලැබේ.

**වැඩිදුර විස්තර සඳහා :**

පෙර පාසල් පාලිකාව -එස්.ජී.එන්.සමරතුංග මිය
දුරකථන :0703712823

**එම්.විකසිත පුෂ්පසූරිය,**
**සභාපති**
කුරුවිට ප්‍රාදේශීය සභාව

දිනය :................................

**පෙර පාසලට නවක ළමුන් ඇතුළත් කිරීමේ නිර්ණායක**

1. **වයස් සුදුසුකම**
   - අදාළ වර්ෂයේ ජනවාරි 31 වන දිනට දරුවා අවම වශයෙන් අවුරුදු 03 සම්පූර්ණ කර තිබිය යුතු අතර, උපරිම වයස් සීමාව පෙර පාසල් නීති අනුව සපුරා තිබිය යුතුය.
2. **පදිංචිය**
   - දරුවාගේ පවුල කිරිඇල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් බල ප්‍රදේශයේ ස්ථිර පදිංචිකරුවන් වීම හා පෙර පාසලේ සිට ආසන්න දුරක පදිංචිකරුවන් වීම.
   - ග්‍රාම නිලධාරී සහතිකයක් හෝ පදිංචිය තහවුරු කරන ලේඛනයක් ඉදිරිපත් කළ යුතුය.
3. **සම්පූර්ණ ලේඛන ඉදිරිපත් කිරීම**
   - උප්පැන්න සහතිකය පිටපත
   - එන්නත් කාඩ්පතේ පිටපත
   - දෙමාපියන්ගේ ජාතික හැඳුනුම්පත් පිටපත්
   - පදිංචිය තහවුරු කිරීමේ ලේඛනය
4. **සෞඛ්‍ය තත්ත්වය**
   - දරුවා පෙර පාසල් අධ්‍යාපනයට සහභාගී වීමට සුදුසු සෞඛ්‍ය තත්ත්වයක සිටිය යුතුය.
   - විශේෂ සෞඛ්‍ය අවශ්‍යතා ඇත්නම් ඒ පිළිබඳ තොරතුරු අයදුම්පතේ සඳහන් කළ යුතුය.
5. **අඩු ආදායම්ලාභී පවුල් සඳහා ප්‍රමුඛතාව**
   - සමෘද්ධිලාභී හෝ අඩු ආදායම්ලාභී පවුල්වල දරුවන්ට ප්‍රමුඛතාව ලබා දේ.
6. **පෙර පාසලේ ධාරිතාව**
   - ඇතුළත් කරනු ලබන දරුවන්ගේ සංඛ්‍යාව පෙර පාසලේ අනුමත ධාරිතාව නො ඉක්මවිය යුතුය. (එක් පෙර පාසල් පාලිකාවක් සඳහා දරුවන් 20ක් පමණ)
7. **සම්මුඛ පරීක්ෂණය / ලේඛන සත්‍යාපනය**
   - දරුවන් ඇතුලත් කිරීමේ දී සම්මුඛ පරීක්ෂණයක් පවත්වා තෝරා ගැනීම
8. **අයදුම්පත් නිකුත් කිරීම**
   - අයදුම්පත් ප්‍රාදේශීය සභා කාර්යාලයෙන්,උප කාර්යාලයෙන්, නිල වෙබ් අඩවියෙන් හෝ පෙර පාසලෙන් නොමිලේ ලබාගත හැක.
   - එක් දරුවෙකු සඳහා එක් අයදුම්පතක් පමණක් භාරගනු ලැබේ.
9. **අයදුම්පත් භාරදීම**
   - සම්පූර්ණ කරන ලද අයදුම්පත් නියමිත අවසන් දිනයට පෙර කුරුවිට ප්‍රාදේශීය සභා කිරිඇල්ල උප කාර්යාලයට භාරදිය යුතුය.
   - අවසන් දිනයෙන් පසුව ලැබෙන අයදුම්පත් භාර නොගනු ලැබේ.

10. **අවසන් අනුමැතිය**

- පෙර පාසල් භාර ගුරුතුමියගේ නිර්දේශය.
- ප්‍රාදේශීය සභා ලේකම්ගේ නිර්දේශය.
- ගරු සභාපතිතුමාගේ අවසන් අනුමැතිය.